**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව 2020/2021**
**අවසාන පරීක්ෂණය - 06 මට්ටම**
**දිලික්ත නීතිය - LLU6814/LWU4326**
**කාලය පැය තුනයි (03)**

---

**දිනයඃ 16.09.2021** **කාලයඃ පෙ.ව 9. 30 සිට ප.ව 12.30 දක්වා.**

---

| |
|---|
| අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ<br><br>කරුණු නීත්‍යානුකුල නොවන ලෙස උපුටා දැක්වීම සහ පිළිතුරු ලිවීම සඳහා සහය ලබා ගැනීම විභාග වරදක් ලෙස සැළකේ. |

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 යි. ප්‍රශ්න හතරකට (04) ට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 ක් හිමි වේ.**

**1.** සමන් දක්ෂිණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකි. විශ්වවිද්‍යාල නීතියට අනුව සියලුම සිසුන් රාත්‍රී 7 ට පමණ එම පරිශ්‍රයෙන් ඉවත් විය යුතුය.

සමන් ජීවත් වූයේ විශ්වවිද්‍යාලය අසල ඔහු කුලියට ගත් එක් කාමරයක ය. තම කාමරයේ විදුලි උපකරණ භාවිතයේ දී අධික ලෙස විදුලිය වැය වන බැවින් අයිතිකරු ඔහුට ඒ සඳහා අවසර ලබා දුන්නේ නැත. දිනක් සමන් තම ලැප්ටොප් පරිගණකයේ පැවරුමක් අවසන් කිරීමට සිදු වූ හෙයින් ශිෂ්‍ය ආපන ශාලාවෙන් පිටත රාත්‍රී 9 දක්වා රැඳී සිටියේය. නිහාල් නම් එක් ආරක්ෂකයෙක් පරිශ්‍රය පරීක්ෂා කරමින් සිටියදී සමන්ව දුටුවේය. ඔවුන් දෙදෙනාම එකම ගමේ අය වූ අතර ඔවුන්ගේ පවුල් අතර හොඳ මිත්‍රත්වයක් නොතිබුණි.

නිහාල් සමන්ට නීති රීති කඩ කර පරිශ්‍රයේ ප්‍රමාද වී සිටීම ගැන බැණ වැදුණේය. සමන් ඔහුට තමාගේ වැඩක් බලාගෙන සිටින ලෙස පැවසුවේය. නිහාල් පසුව සමන්ව බිමට තල්ලු කර "මෙය ඔබේ පවුලට හොඳ පාඩමක් උගන්වයි" යැයි කියමින් ඔහුට පයින් ගසන්නට විය. සමන් කෑ ගසන හඩ ඇසී ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරියා වන දිනේෂ් කුමක් සිදුවේ දැයි බැලීමට පැමිණියේය. සමන් ඔහුගෙන් උදව් ඉල්ලා ආයාචනා කළ විට දිනේෂ් පිළිතුරු දුන්නේ "ඔබට ශිෂ්‍යයන් ලෙස හික්මීමක් තිබිය යුතුයි. ඔබ සැමවිටම නීති කඩ කරයි" යනුවෙනි. නිහාල් සමන්ට පහර දීම දිනේෂ් නැවැත්වුවේ නැත. නිහාල්ගේ පහර දීමෙන් සමන්ගේ ශරීරයේ කැපීම් සහ තැලීම් සිදුව තිබුණි.

දිනේෂ් විශ්වවිද්‍යාලයේ සේවකයෙකි. නිහාල් රැකියාව කරන්නේ රක්නා සේවා (පුද්ගලික) සමාගම නම් පුද්ගලික ආරක්ෂක සමාගමක වන අතර එය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක රාජකාරිවලට සහාය වීම සඳහා ගිවිසුම් ගත වී ඇත.

හානි සඳහා නඩුවක් පැවරීමට සමන්ට අවශ්‍යය. ඔහුට උපදෙස් ලබා දෙන්න.

**2.** *ඇන්ස් එදිරිව මර්ටන් ලන්ඩන් බරෝ කවුන්සිල්* [1978] AC 728 නඩුවෙහි *විල්බර්ෆෝර්ස්* සාමිවරයාට අනුව අවධානයේ යුතුකම ස්ථාපිත කිරීම සඳහා ස්ථාපිත කළ යුතු අදියර දෙකක් තිබේ.

"පළමුව, වැරදිකරුවා යැයි කියන දෝෂ සහගත පුද්ගලයා සහ හානියට ලක් වූ පුද්ගලයා අතර සමීපත්වය හෝ අසල්වැසිභාවය මත පදනම් වූ ප්‍රමාණවත් සම්බන්ධතාවයක් තිබේද යන්න පිළිබඳව විමසිය යුතු අතර දෝෂ සහගත පුද්ගලයාට ඔහුගේ පාර්ශවයෙන් තමාගේ නොසැලකිලිමත්භාවය මත පසුව හානියක් උද්ගත වන බවට යුක්තිසහගත ලෙස කල්පනා කිරීමට හැකියාවකින් යුක්ත වන්නේ නම් එවැනි අවස්ථාවක බැලු බැල්මට අවධානයේ යුතුකම පැන නගී."

"දෙවනුව" පළමු ප්‍රශ්නයට අස්ත්‍යර්ථ (Affirmative) ලෙස ඔව් යන පිළිතුරු දෙනු ලැබුවහොත් ඉන් පසුව එම යුතුකමේ පරිමාණය හෝ එම යුතුකම පවතින පුද්ගල කොට්ඨාසය හෝ එයින් උද්ගත වන හානියේ ප්‍රමාණය නිෂේධනය කිරීමට හෝ අඩු කිරීමට හෝ සීමා කිරීමට හේතු වන කරුණු තිබේද යන්න සලකා බැලිය යුතුය."

**(අ)** ඇල්කොක් එදිරිව යෝක්ෂයර් හි ප්‍රධාන කොස්තාපල් [1991] 4 All ER 907 සහ **(ආ)** කැපැරෝ ඉන්ඩස්ට්‍රීස් පීඑල්සී එදිරිව ඩික්මන් සහ වෙනත් අය [1990] 1 All ER 568 යන නඩු තීරණ පරීක්ෂා කර ඇන්ස් නඩු තීරණයේ අදියර දෙකේ පරීක්ෂණයට [Two Stage Test] කොතරම් දුරට අනුකූල වන්නේද යන්න සාකච්ඡා කරන්න.

**3.** මහෙස් ඇඟලුම් කම්හලක හිමිකරුවෙකි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සියළුම සේවකයින් අවම වශයෙන් මීටර දෙකක්වත් ඈතින් වාඩිවී සිටීම සහ වෛද්‍ය ශ්‍රේණියේ මුහුණු ආවරණ පැලඳීම සහතික කිරීම අවශ්‍ය වේ. මහෙස් මෙම උපදෙස් අනුගමනය කර ඇත. වර්තමානයේ පැතිරී යන නව ඔමේගා ප්‍රභේදය හේතුවෙන් කොවිඩ් 19 කාර්යය සාධක බලකාය නිර්දේශ කර ඇත්තේ සේවකයින් මීටර් 4 ක් ඈතින් වාඩි වී පූර්ණ පීපීඊ උපකරණ පැළඳිය යුතු බවයි. කෙසේ වෙතත් මහේස්ට එසේ කළහොත් ඔහුගේ සියලුම සේවකයින් ගෙන්වා සේවයේ යොදා ගැනීමට නොහැකිය. තවද පීපීඊ උපකරණ සඳහා යන වියදම නිෂ්පාදන පිරිවැයට සැලකිය යුතු ලෙස එකතු කිරීමට ද සිදු වේ.

කර්මාන්තශාලා සෞඛ්‍ය පරීක්ෂක නිමල් මහේස්ට උපදෙස් දුන්නේ සේවකයින් මීටර් තුනක් දුරින් තැබීම ප්‍රමාණවත් බවත් ඔවුන්ට පීපීඊ උපකරණ ලබා දීම අවශ්‍ය නොවන බවත් ය. ඔහු මහෙස්ට පැවසුවේ ඔමේගා ප්‍රභේදය අවස්ථා දෙකක පමණක් ලංකාවෙන් හමු වූ බවත් වෛරසය පාලනය විය හැකි බවත් ය.

මහේස් නිමල්ගේ උපදෙස් අනුගමනය කළේය. මාසයකට පසු සේවකයින් 15 දෙනෙකුට ඔමේගා ප්‍රභේදය ආසාදනය වී ඇති බව හඳුනා ගන්නා ලදී. ඔමේගා ප්‍රභේදය පැතිරීම නිසා රෝගී වූ කම්කරුවෙකුගේ දියණියක වූ කමනි රෝගය ආසාදනය වීමෙන් පසුව හඳුනා ගන්නා ලදි. අනිවාර්ය නිරෝධායන කාලය නිරීක්ෂණය කිරීමෙන් පසු ඇය ආසාධිත බව හඳුනා ගෙන තිබේ.

**අ).** දියවැඩියාව සහ ඇදුම රෝගයෙන් පෙළෙන ශාන්ති දැඩි ලෙස රෝගාතුර වූ අතර වෛද්‍ය වියදම් සඳහා රුපියල් මිලියනයක් වැය කිරීමට සිදු විය. ශාන්ති ආගමික හේතු මත එන්නත ලබා ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි.

**ආ).** මාලිනීගේ වයෝවෘද්ධ මව ඇයගෙන් වෛරසය ආසාදනය වී මිය ගියාය. එන්නත ලබා ගැනීම සඳහා ඇය මාස කිහිපයක් බලා සිටියාය. ඇගේ මව කුඩා දරුවන් දෙදෙනා රැකබලා ගත් හෙයින් මාලිනීට දැන් දරුවන් රැකබලා ගැනීම සඳහා වියදම් දැරීමට සිදු වී ඇත.

**ඇ).** සුමනා නිරෝධායන මධ්‍යස්ථානයකට යවා ඇති අතර ඇය එහි සිටියදී හුස්ම ගැනීමට නොහැකිව කොවිඩ් රෝගයෙන් පුද්ගලයන් කිහිප දෙනෙක් මිය යන බව දුටුවේය. සුමනා ස්නායු කම්පනයට ලක් වූ අතර ඇය සුවය ලැබීමෙන් පසු රෝහලේ මනෝචිකිත්සක වාට්ටුවට යවන ලදි.

**ඈ).** මහෙස්ගේ කර්මාන්ත ශාලාව මාස තුනක් වසා දමා තිබූ අතර ඔහු ආර්ථික වශයෙන් පාඩු ලැබීය.

ශාන්ති, මාලිනී, සුමනා සහ මහේස් යන තිදෙනාම වන්දි ඉල්ලා නඩු පැවරීමට අදහස් කරයි.

(i) ඔවුන්ට නඩු පැවරිය හැක්කේ කාටද සහ

(ii) කුමන පදනමක් මතද යන්න සාකච්ඡා කරන්න.

**4.** "අනතුරෙන් ඉතා දුරස්ථ යැයි සලකන හානි සඳහා නීතිය මඟින් වන්දි ලබා නොදේ. <u>මෙය පෙනෙන පරිදි කරුණුවලට වඩා නීතිය පිළිබඳ ප්‍රශ්නයකි.</u> එම නීතිය හානි අයකර ගැනීම සඳහා සීමාවක් පනවා ඇත..."

Harpwood, Principles of Tort Law, 3rd edition, (1997) 23 වන පිටුව

විත්තිකරු විසින් සිදු කරන හානිය දුරස්ථද නැද්ද යන්න තීරණය කිරීමට උසාවි භාවිතා කරන නෛතික මූලධර්ම සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර නඩු තීන්දු නීතියෙන් සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. ඔබේ පිළිතුරේදී ඔබ විශේෂයෙන්, උපුටා දැක්වීමේ යටින් ඉරි ඇඳි වැකිය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

**5.** 14 (1) (අ) වගන්තියෙන් ප්‍රකාශිත සහ පිළිගත් මූලික අයිතිවාසිකම භුක්ති විඳීම සහ ක්‍රියාත්මක කිරීම [එනම් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සඳහා ඇති අයිතිය] ... අපහාස කිරීම සම්බන්ධව නීතියෙන් නියම කළ හැකි එවැනි සීමා වලට යටත් විය යුතුය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 15 (2) වගන්තිය

අපහාස කිරීමේ නීතිය මගින් අනවශ්‍ය ලෙසින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සීමා නොකරන බවට වග බලා ගැනීමට අධිකරණය ක්‍රියා කරන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරට සහය දැක්වීම සඳහා ශ්‍රී ලංකාව සහ වෙනත් අධිකරණ බල ප්‍රදේශ යන දෙකෙන්ම නඩු තීරණ ඉදිරිපත් කරන්න.

- *සියලුම හිමිකම් ඇවිරිණි* -